# 12 - පාඩම
# නිවැරදිව කියවමු

- ❖ නිපුණතාව- ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත්ව යොදා ගනියි .
- ▪ නිපුණතා මට්ටම - නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි ,
- ▪ විවිධ ශෛලීන්වලින් රචිත පොත පත කියවයි.
- ❖ නිපුණතාව - භාෂාත්මක කාර්යයේදී වාක්කෝෂය , භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි .
- ▪ නිපුණතා මට්ටම - වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි ,



# ක්‍රියාකාරකම - 1

➢ **පහත දී ඇති කොටුව තුළ ඇති වාක්‍යාංශ සඳහා ගැළපෙන වාක්‍යාංශ සොයා යා කරන්න .**

අසා රස විඳීම අරමුණු කර ගෙන ය.

පරිපූර්ණ කරයි .

පැහැදිලි උච්චාරණයෙන් කියවිය යුතුය.

- ❑ කියවීම මිනිසා ,
- ❑ කියවීමේ මූලික ප්‍රභේද දෙක වන්නේ,
- ❑ ශබ්ද නගා කියවීමේදී ,
- ❑ විරාම ලකුණු පිළිබඳව සලකිලිමත් වෙමින් කියවීම තුළින් ,
- ❑ පැරණි බණ කතා රචනා කර ඇත්තේ ,
- ❑ කියවීමෙන් නිසි පල ලැබීමට නම් ,

ශබ්ද නගා කියවීම හා නිශ්ශබ්ද කියවීමයි .

අසා සිටින්නන්ගේ අවධානය දිනා ගැනීමට හැකි වේ .

එය නිවැරදිව කළ යුතුය.

# ක්‍රියාකාරකම - 2

➤ පහත දැක්වෙන එක් එක් අවස්ථා උපුටා ගෙන ඇත්තේ කුමකින් ද යන්න තෝරා හිස් කොටුවේ ලියන්න .

1.“මහණ , ගොයුම්හු ඊට කාරණ දනිති .ඉන්ද්‍රශාල ගුහාවෙහි දී ශක්‍රයන් වැඳ ගෙන හොත් ගමනේ ම මළවුන්ට ……. ”

2.“සභාපතිතුමාගේ ස්තුති කතාවෙන් පසු ප . ව . 5. 30ට පමණ සභා තොමෝ සතුටින් විසිර ගියා ය ……….. ”

3.“ වැද්දන් ආපසු එතියි මම නො සිතමි , සොඳුර.එහෙත් ආවත් , ඔබට අනතුරක් වන්ට ඉඩ නො දෙමි , ……”

3.“ආපත්සු මිත්‍රං ජානීයාත් - යුද්ධෙ ශුරමෘණේ ශුචිම් ……………….”

සමිති වාර්තාවක්

හිතෝපදේශය

මනමේ

සද්ධර්මරත්නාවලිය

# ක්‍රියාකාරකම - 3

➢ නොගැළපෙන පදය සහිත කොටුව රවුම් කරන්න .

| | | | | |
|---|---|---|---|---|
| 1 .අඹ - | ජලය | ජගත් | විශ්වාසය | භාර්යාව |
| 2. අත - | ලියුම | හස්තය | දිශාව | වාරය |
| 3.ගත - | ග්‍රන්ථය | සිරුර | ගත්තොත් | අඳුර |
| 4.දද - | කුෂ්ඨ | දත් | කොඩි | බමුණා |
| 5.වර - | වනය | උතුම් | වාරය | එන්න |
| 6. වස් - | සඳහා | වර්ෂය | මුහුණ | වයස |

# ක්‍රියාකාරකම - 4

පහත දැක්වෙන රූප සටහන්වල මැද රවුමේ ඇති බහ්වර්ථ පදයට ගැළපෙන පදය තෝරා හිස් තැන් පුරවන්න.




- ශාස්ත්‍රය
- භික්ෂුව
- හංසයා
- තාත්තා
- මිනිස්සු

# ක්‍රියාකාරකම - 1
# පිළිතුරු

✓ නිවැරදි ව යා කරමු .





# ක්‍රියාකාරකම - 2
# පිළිතුරු

1 සද්ධර්මරත්නාවලිය

2 සමිති වාර්තාවක්

3 මනමේ නාට්‍යය

4 හිතෝපදේශය

# ක්‍රියාකාරකම - 3
# පිළිතුරු

1 ජගත්

2 ලියුම්

3 අඳුර

4 දත්

5 වනය

6. මුහුණ



# ක්‍රියාකාරකම - 4
# පිළිතුරු



- **සත්**: සත්වයා, හත, ශාස්ත්‍රය, යහපත
- **හස**: ලකුණ, හංසයා, සිනාව, අශ්වයා
- **හිමි**: භික්ෂුව, සැමියා, ස්වාමිය, අයිතිය
- **දන**: ධනය, දානය, මිනිස්සු, දැවිල්ල
- **පිය**: පියාපත, පාද, හිතවත්, තාත්තා